09.05.2025

# ද මැසිනොද් විදුහල - කඳාන

## 1 වාර පරීක්ෂණය -2025

## සිංහල

**08 ශ්‍රේණිය** | **කාලය: පැය 2යි**

Learning Resource Center
R
De Mazenod College
Kandana

## I කොටස

- **පහත සඳහන් වාක්‍යවල ඉරි ඇඳි කොටසේ අර්ථයට වඩාත් සමීප පිළිතුර තෝරන්න.**

(01) අයියා බයිසිකලය පණ ගන්වා ලැල්ලට <u>පාගා</u> ගියේය.

1. සතුටින්
2. ඉතා වේගයෙන්
3. ලැල්ලට උඩින්
4. පාරේ ගමන් කළ

(02) මා අවුරුදු උත්සවයේ මීටර් සියය දිවීමේ තරගයෙන් ප්‍රථමයාවූ බව අසූ අම්මාගේ <u>එහේ මලක් පිපුණු</u> බව ඇ කීවාය.

1. අධික සතුටක් ඇතිවූ බව
2. මලක් හිටවූ බව
3. ඔළුවේ මලක් පිපුණු බව
4. මලක් දුටු බව

(03) ඊයේ තදින් හැමූ සුළඟට ගෙයි වහලය කඩා වැටී ගිය වේලේ වැස්සක් වහින්නට විය. සීයා පැත්තක හිඳ <u>කොරේ පිටට මරේ</u> යැයි පැවසුවේය.

1. කකුලේ කොරයක් ඇති බව
2. කොර මිනිසා මැරුණු බව
3. කරදර පිට කරදර
4. මැරුණු මිනිසා කොරෙකු බව

(04) "පුරානෝක්ති" යන්නෙහි අර්ථය වන්නේ,

1. පැරණි නටඹුන්
2. පැරණි කියමන්
3. පැරණි රජවරු
4. පුරහඳ

- **පහත සඳහන් වාක්‍යවල හිස්තැන් වලට සුදුසු වචනය තෝරන්න.**

(05) නිවේදනයකට හෝ පණිවිඩයකට හෝ .............................. දැක්විය යුත්තේ ද අවධානයෙන් යුක්තව සවන් දීමෙනි.

1. ප්‍රතිචාර
2. සවන් දීම
3. සන්නිවේදනය
4. අත්දැකීම

(06) කවි රස විඳීමට .............. හෙවත් පුරුද්දක් තිබිය යුතුය.

1. කැමැත්තක්
2. බලයක්
3. කරුණු
4. හුරුවක්

(07) පහත සඳහන් පද අකාරාදි පිළිවෙලට සැකසූ විට නිවැරදි පිළිතුර වන්නේ

A වැලිමඩ
B ඇල්ල
C අලව්තුපිටිය
D රත්මලාන
E කටුනායක

1. D B C E A
2. B D C E A
3. A B C D E
4. B D E A C

(08)පහත සඳහන් වචනවල ඇති මහප්‍රාණ අකුරු පමණක් ඇති පිළිතුර වන්නේ

නිධාන, සෞඛ්‍යය, අඹ, අඬනවා, කසය, තාපය

1. ස,ඹ
2. ඹ,ඬ
3. ධ,ඛ
4. ක,ත

(09)නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචන ඇති පේළිය වන්නේ,

1. ත්‍යාග ප්‍රදානය, කණිෂ්ඨ, පරිගණක, කෘතිම
2. කණිෂ්ඨ, පරිගණකය, ත්‍යාග ප්‍රධානය, කෘත්‍රිම
3. ත්‍යාග ප්‍රදානය, කනිෂ්ඨ, පරිගණකය, කෘත්‍රිම
4. කනිෂ්ඨ, පරිඝණකය, ත්‍යාග ප්‍රධානය, කෘතිම

(10) පහත වාක්‍යයේ ඇති ඒක වචන පදය තෝරා ලියන්න.

මූවෝ ගං ඉවුරුවල කැනින් තැන හිටගෙන වැට දෙස බල බලා සිටිති.

- **පහත යුගල පදවල හිස්තැන්වලට සුදුසු කොටස පුරවන්න.**

(11) ළමයි ..............

(12) .............. කුඩුම

(13) උත්තම පුරුෂ ඒක වචන උක්ත පදය වන්නේ,

1. අපි
2. මම
3. මා
4. නුඹ

- **පහත සඳහන් වචනවල අර්ථ සිංහල ශබ්දකෝෂයේ සටහන් කර ඇත්තේ කෙසේද?**

(14) කිරි කෑ මුත්තා

1. කිරි කන මුත්තා
2. හත්මුතු පරම්පරාවේ අන්තිමයා
3. කිරිපැනි කනවා
4. සීයගෙ තාත්තා

(15) කිරිකෝඩු

1. කිරිබත්
2. කුඩා දරුවා
3. සිරිපා වදින්නට මුල් වරට යන තැනැත්තා
4. කිරිපැණි

(16) කිරි පුබ්බරු

1. කිරිබත්
2. පොල් කිරි
3. පුම්බගෙන සිටින
4. එළකිරි

(17) සිංහල අක්ෂර මාලාවේ ඇති අල්ප ප්‍රාණ අක්ෂර දෙකක් ලියන්න.

(18) අක්ෂර මාලාවේ ඇති සඤ්ඤක අක්ෂර දෙකක් ලියන්න.

(19) පහත සඳහන් පදවලට විරුද්ධ අර්ථය දෙන පදය පිළිවෙලින් ලියා ඇති පේළිය තෝරන්න.

ආගන්තුක - අවමානය - මුකුලිත - කෘත්‍රිම

1. ආගමනය - මාන්නය - පැසුණු - කෘතිම
2. අපනයනය - සම්මානය - වැඩුණු - ස්වාභාවික
3. නේවාසික - අපවාදය - විකසිත - ස්වාභාවික
4. නේවාසික - සම්මානය - විකසිත - ස්වභාවික

(20) පහත වාක්‍යයේ හිස්තැනට සුදුසු අතීත කාල ආඛ්‍යාතය වන්නේ

කුඩා ළමෝ සතුටින් එකමුතුව ක්‍රීඩා ..............................

1. කරති
2. කළේය
3. කළහ
4. කළාය

Learning Resource Center
R
De Mazenod College
Kandana

## II කොටස

- **පළමු ප්‍රශ්නය හා දෙවන ප්‍රශ්නය අනිවාර් ය වන අතර අනෙකුත් ප්‍රධාන ප්‍රශ්නවලින් තුනක් තෝරා ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

(01) පළමු වන වාරයේදී ඔබ නිර් මාණය කළ පොත් පිංස ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. ඔබේ නිර් මාණය ට යෙදූ නම කුමක්ද? (ලකුණු 2)
2. එම නිර්මාණය කිරීමට ඔබට ගුරුතුමාගෙන් හෝ ගුරුතුමීගෙන් ලැබුණු උපදෙස් දෙකක් ලියන්න. (ලකුණු 4)
3. එම නිර්මාණය කිරීමෙන් ඔබට ලැබුණු ප්‍රයෝජන දෙකක් ලියන්න. (ලකුණු 4)
4. මෙම නිර්මාණය කිරීමේදී ඔබ කරුණු සපයා ගත් මූලාශ්‍ර තුනක් නම් කරන්න. (ලකුණු 3)
5. ඔබ ලියූ ජන කතාවක් නම් කරන්න. (ලකුණු 1)
6. මෙම නිර්මාණය සඳහා ඔබ භාවිතා කළ ද්‍රව්‍ය දෙකක් නම් කරන්න. (ලකුණු 2)

(මුළු ලකුණු 16)

(02) පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරා ගෙන වචන දෙසීයකට නොඅඩු රචනයක් ලියන්න.

1. ගස් වවා පරිසරය සුරකිමු.
2. හොඳ වචන කතා කරමු.
3. මගේ ලොවේ වීරයා /වීරවරිය.
4. උපන් මව්බිම මට අගනේය.

(ලකුණු 14)

(03) පහත සඳහන් සංවාද වලින් එකක් තෝරා සංවාදයක් ගොඩනගන්න.

1. ඔබේ අංශය මගින් පැවැත්වෙන අවුරුදු උත්සවය නැරඹීමට ඔබ පාසලේ විදුහල්පති තුමාට ආරාධනා කරන අවස්ථාව
2. ඔබ පාසලේ පැවැත්වෙන ක්‍රීඩා උත්සවය නැරඹීම සඳහා ඔබේ හොඳම මිතුරාට ආරාධනා කරන අවස්ථාව
3. ඔබට කියවීමට අවශ්‍ය පොත් ලබා ගැනීමට පොත් හලකට ගිය අවස්ථාව

(ලකුණු 10)

(04) පහත සඳහන් වාක්‍යවල හිස්තැන් වලට සුදුසු උක්ත පද යොදන්න.

1. ...................... මල් පූජා බුදුන් වැන්දෙහි.
2. ...................... සතුටින් පාඩම් කළාය.
3. ...................... අශ්වයන් පිට නැගී ගමන් කළහු.
4. ...................... ප්‍රදර්ශනය නැරඹීමට ගියෙමි.
5. ...................... සෞඛ්‍ය නීති පිළිපදිමු.
6. ...................... උදෙන්ම පාසල් ආවෝය.
7. ...................... රෝගියාට බෙහෙත් දැම්මාය.
8. ...................... බුරමින් පාරේ දිවූහ.
9. ...................... ගෙය බිඳ බඩු රැගෙන යති.
10. ...................... සරුංගල් අහසේ පාවෙනු දුටුවෙහුද?

(05) පහත සඳහන් කවිවල ඉතිරි පද ඔබ විසින් නිර්මාණය කර හිස්තැන් පුරවන්න.

1. ටිංටිං ගාලා
අතු උඩ දුවලා
..........................................................................
..........................................................................

2. දස මස මා ඔබ කුසේ දරාලා
ලේ කිරි කිරිකරමින් මා හට පොවලා
..........................................................................
..........................................................................

3. කන්ද උඩින් ඉර පායන වෙලාවට
කුරුළු නදින් අවදිවුණා සිරුවට
..........................................................................
..........................................................................

4. උම්බෑ ගගා පොඩි වසු පැටවුන් නැටුවා
කිරි ටික දෝවන් අපේ මාමා පොළට ගියා
..........................................................................
..........................................................................

5. හෝ හෝ ගගා මුහුදේ රැළි නැගෙන්නේ
හක් ගෙඩි සිප්පි කටු මතුවී පෙනෙන්නේ
..........................................................................
..........................................................................

(ලකුණු 2×5=10)